ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය ("මණ්ඩලයේ") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින්, සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා 1971 අංක 38 දරන මුදල් පනත සහ 2019 අංක 23 දරන ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 10(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLSFR for SMEs) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිවන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලය පසුගිය වසර හතර තුළ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.මිලියන 1.78 ක වටිනාකමැති ස්ථාවර වත්කම්වල නිවැරදිතාවය පිළිබඳව තහවුරු කරගත නොහැකි විය. තවද මණ්ඩලයට අයත් ප්‍රොජෙක්ටරයක්, මුද්‍රණ යන්ත්‍ර දෙකක්, වානේ කබඩ් 6ක්, සෝෆාවක් සහ ශීතකරණයක් මූල්‍ය ප්‍රකාශනවලට සහ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බවද නියැදි පරීක්ෂණයකට අනුව නිරීක්ෂණය විය.	සුදුසු ස්ථාවර වත්කම් ලේඛනයක් සම්පාදනය කරමින්, පුළුල් ස්ථාවර වත්කම් සත්‍යාපනයක ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ලබා දී ඇති පැවරුම සම්පූර්ණ කිරීමත් සමඟ මෙය නිවැරදි කරනු ඇත.	වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ පවත්වා ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව හා සම්පූර්ණව පවත්වා ගත යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාළ නිවැරදි කිරීම් සිදුකළ යුතුය.

1.5.2 කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්‍වයන් සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (SLFRS for SMEs) 10.15 සිට 10.18 දක්වා වූ විධිවිධාන අනුව වත්කම්වල ඵලදායී ආයුකාලය කාලානුරූපීව සමාලෝචනය කර ගිණුම්ගත කළ යුතු වුවද 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4.71 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වර්තමානයේදී ද භාවිතා කරනු ලබන වත්කම්වල ඵලදායී ආර්ථික ආයු කාලය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2022 වර්ෂයේ සිටම එම වත්කම් මූල්‍ය ප්‍රකාශනයෙන් සහ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී ද ස්ථාවර වත්කම් ලේඛනය තුළ සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු.මිලියන 0.83 ක වත්කම් පැවතිය ද ඒ පිළිබඳ හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.	සුදුසු ස්ථාවර වත්කම් ලේඛනයක් සම්පාදනය කරමින්, පුළුල් ස්ථාවර වත්කම් සත්‍යාපනයක ක්ෂේත්‍ර කටයුතු අපි සම්පූර්ණ කර ඇත්තෙමු. අපි මෙම පැවරුම ස්වාධීන සමාගමක් වන Messrs MNGP Associates, Chartered Accountants වෙත පවරා ඇති අතර, ඔවුන්ගේ අවසාන වාර්තාව සම්පූර්ණ කිරීමෙන් පසු, තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් නිසි ලෙස තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ අපගේ QB ගිණුම්කරණ පද්ධතියට ගෙන යනු ඇත.	කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්‍වයන් සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල ඵලදායී, ආර්ථික ආයු කාලය සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මණ්ඩලය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු.මිලියන 1.68 ක වාර්ෂික බදු කුලියකට පර්චස් 30 ක ඉඩමක් වසර 30 ක කාලයක් සඳහා 2021 දෙසැම්බර් 29 වන දින නාගරික සංවර්ධන අධිකාරියෙන් බදු ගිවිසුමක් යටතේ ලබාගෙන තිබුණි. මෙම ඉඩම සඳහා බදු කුලිය ගෙවමින් පැවතියද භාවිත අයිතිය ඇති වත්කමක් සහ කල්බදු වගකීමක් ලෙස සමාලෝචිත වර්ෂයේදී ද දේපළ පිරියත හා උපකරණ යටතේ හෝ වෙන්ව හෝ ගිණුම්ගත කර නොතිබුණු අතර, කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්‍වයන් සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ 20.16 ඡේදය අනුව අවශ්‍ය හෙළිදරව් කිරීම්ද සිදු කර නොතිබුණි.	ශේෂ පත්‍රයේ වත්කම භාවිත කිරීමේ අයිතිය හා වගකීම හඳුනා ගැනීම අවශ්‍ය වන්නේ මූල්‍ය කල්බදුවක් සම්බන්ධයෙන් පමණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS 17) යටතේ, නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් බදු දීම ස්ථාවර වත්කම් යටතේ දිගුකාලීන වත්කමක් ලෙස සැලකිය හැකි බව විධිවිධාන ඇත. 2021 දෙසැම්බර් 29 වන දින නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය අතර අත්සන් කරන ලද අංක 367 දරන බදු ගිවිසුමට අනුව, යම් යම් අයිතිවාසිකම් තිබෙන අතර විශේෂයෙන් බදුකරුට එනම් CCI(SL) වසර 30 ක කල්බදු	භාවිත අයිතිය ඇති වත්කමක් සහ කල්බදු වගකීමක් ලෙස දේපළ පිරියත හා උපකරණ යටතේ හෝ වෙන්ව හෝ ගිණුම්ගත කළ යුතු අතර ප්‍රමිතියේ 20.16 ඡේදය අනුව අවශ්‍ය හෙළිදරව් කිරීම් ද සිදු කළ යුතුය.

		කාලය තුළ අනාගත ආදායම් උත්පාදනය කළ හැකි ඉහළ කාර්යාල සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීම සමඟ බදු දී ඇති ඉඩම භාවිතා කිරීමෙන් භුක්ති විඳීමට අයිතියක් ඇත, සහ කාලය අවසන් වී කල්බදු දීම අවසන් කිරීමෙන් පසු අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ නියමයන් සහ කොන්දේසි සහිතව අලුත් කිරීමේ අයිතිය හිමි වනු ඇත.	
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ ලෙජරයට අනුව මුදලින් ගෙවන ලද ආදායම් බද්ද රු.මිලියන 4.12ක් වුවද කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්‍වයන් සඳහාවන මුල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (SLFRS for SMEs) 7.4(ඉ) ඡේදයට අනුකූල නොවන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් යටතේ වර්ෂයට අදාළ ආදායම් බදු වටිනාකම ලෙස රු. මිලියන 4.37 ක් දක්වා ඇති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යෑම රු. මිලියන 0.25 කින් වැඩියෙන් දක්වා තිබුණි.	මෙය සිදුවන්නේ WHT සැලකිල්ලට ගැනීම නිසාය. ස්ථාවරතැන්පතු ප්‍රාග්ධනය/ පොළිය/ WHT සම්බන්ධයෙන් මණ්ඩලය විසින් සම්මත කරන ලද ගිණුම්කරණ සටහන් මුදල් දෙපාර්තමේන්තුවේ සහ QB ගිණුම්කරණ පද්ධතිය තුළ ඇත.	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් යටතේ මුදලින් ගෙවූ ආදායම් බදු වටිනාකම දැක්විය යුතුය.
(ඈ)	කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්‍වයන් සඳහාවන මුල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (SLFRS for SMEs) 2.36 ඡේදය අනුව මණ්ඩලයේ සාමාජික දායකත්ව ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කළයුතු වුවද මුදල් පදනම මත එම ආදායම රු.මිලියන 6.38 ක් ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ අනුව පෙර වර්ෂවලට ආදාළව ලැබුණු රු.මිලියන 0.58 ක් ද 2025 වර්ෂයට අදාළව ලැබුණු රු. මිලියන 0.39 ක් ද 2024 වර්ෂයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද 2021 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු රු. මිලියන 0.99 ක සාමාජික දායක මුදල් ගිණුම්ගත කර නොතිබුණි.	වාර්ෂික සාමාජිකත්වයන් සත්‍ය ලැබීම් පදනම මත ගිණුම්ගත කිරීම පිළිවෙතවන අතර අනාගතයේදී අපි ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ද ඇතුළත් කරනු ඇත.	වර්ෂයට අදාළ සියලුම ආදායම් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශනවලට හඳුනා ගත යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ණයගැතියන් විසින් මණ්ඩලයේ බැංකු ගිණුම් වෙත සිදු කළ සෘජු තැන්පතු රු. මිලියන 0.11 ක් අදාළ ණයගැතියා හඳුනානොගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනෙකුත් වගකීම් යටතේ "හඳුනා නොගත් ණයගැති ලැබීම්" ලෙස දක්වා තිබුණු බැවින් 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන් හා වගකීම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	මෙය ඉදිරි වසර තුළ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හැකි වනු ඇත.	දෛනික ණයගැති ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතුය.
(ආ)	පසුගිය වර්ෂයේදී ගිණුම්ගත නොකළ සාමාජික ගාස්තු ආදායම් හා විදුලිය ඇතුළු අනෙකුත් වියදම්හි ශුද්ධ වෙනස වූ රු. මිලියන 0.12 ක පූර්ව වර්ෂ ගැලපීම්වලට අදාළ තොරතුරු ගිණුමේ හෙළිදරව් කර නොතිබුණු අතර එම අගය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සමුච්චිත ලාභයට ගැළපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කර තිබීමෙන් 2024 වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	පද්ධතිය ලබන වසරේ සිට නිවැරදි කරනු ඇත.	පූර්ව වර්ෂවලට අදාළ ගැලපීම් සමුච්චිත ලාභයට ගැළපීම් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 0.09 කට මිලදී ගත් පරිගණක දෘඪ තැටි අයිතම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර නඩත්තු වියදම් ගිණුමට ඇතුළත් කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ශේෂය එම ප්‍රමාණයෙන් ඌණ ගණනය වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පරිගණක ක්ෂය වටිනාකමද අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.	මේවා නිවැරදි කර වත්කම්වලට ඇතුළත් කරනු ලබන අතර ලබන වසරේ දී ක්ෂයවීම් ද නිවැරදිව සකස් කරනු ඇත.	මිලදී ගනු ලබන ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන අදාළ ස්ථාවර වත්කම් ගිණුමෙහි ගැලපීම් කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් ප්‍රදර්ශන ආදායම තුළ 2025 වර්ෂයේ පැවැත්වීමට නියමිත ප්‍රදර්ශනය සඳහා වෙළඳ කුටි කුලියට දීමෙන් ලැබූ රු.මිලියන 0.46 ක ආදායම් ද ඇතුළත් වී තිබීමෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.	පෙර වර්ෂ ගැලපුම් ඇතුළත් කිරීම මඟින් මෙම මුදල 2025 ආදායමට ඇතුළත් කරනු ඇත.	ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු බැවින් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය.

(ඉ)	සමාලෝචිත වර්ෂයේදී 2025 වර්ෂයට අදාළ දිනපොත්වල දැන්වීම් පළ කිරීමෙන් උපයන ලද ආදායම වූ රු.මිලියන 0.97 ක් විලම්භිත ආදායම් ගිණුමට බැර කර තිබුණ ද එම දිනපොත් මුද්‍රණ වියදම් හා ඒ හා සම්බන්ධ අනෙකුත් වියදම වූ රු.මිලියන 0.72 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.	අනාගතයේදී අපි පෙරගෙවුම් වියදම් වැනි දේ ඉදිරියට ගෙන යන අතර එම අදාළ ආදායම ගිණුම්ගත කරන වර්ෂයේදී ඒවාට අදාළ වියදම් ද ගැලපුම් කරනු ඇත.	ආදායම සහ ඊට අදාළ වියදම් අදාළ කාලය තුළම ගැලපුම් කළ යුතු බැවින් අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතුවල රු.මිලියන 2ක් ආයෝජනය කර තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.මිලියන 11.76ක් ස්ථාවර තැන්පතු ආයෝජන ලෙස දක්වා තිබුණි. එසේම වර්ෂයට අදාළ රු. මිලියන 9.29 ක් වූ ස්ථාවර තැන්පතු ආයෝජන පොළිය නැවත ආයෝජනය කර තිබුණද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම ලෙස දක්වා තිබුණි.	කළමණාකරණය විසින් අදහස් දක්වා නොමැත.	වර්ෂයේ ආයෝජන වටිනාකම නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සටහන් කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 319 වගන්තිය	මණ්ඩලය සංස්ථාගත කිරීමට පෙර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක විය. එසේ වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු නිෂ්කාශන සහතිකය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් සමාගමේ ඈවර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට මණ්ඩලය 2025 අගෝස්තු 10 දින දක්වා අපොහොසත් වී තිබුණි.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	බදු නිශ්කාශන සහතික ලබාගෙන සමාගම ඈවර කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	2023 සැප්තැම්බර් 27 දිනැති අංක PED 01/2021(iii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	සෑම ආයතනයක්ම එම ආයතනයට සුවිශේෂී පරිපාලන හා මූල්‍ය මාර්ගෝපදේශ හා අත්පොත් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද මණ්ඩලය විසින් එම අත්පොත් සකස්කර අනුමත කරගෙන නොතිබුණි.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	චක්‍රලේඛ උපදෙස් පරිදි මණ්ඩලයට සුවිශේෂී පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 14.04 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 16.11 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 2.07 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයට අදාළ වියදම් රු.මිලියන 8.32 න් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

විස්තරය	2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම (රු. මිලියන)	2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම (රු. මිලියන)	වෙනස {වැඩිවීම/ (අඩුවීම)} (රු. මිලියන)	වෙනසේ ප්‍රතිශතය (සියයට)
<u>ආදායම්</u>				
ඉදිකිරීම් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය	25.86	27.88	(2.02)	7
සාමාජික ගාස්තු	6.38	4.97	1.41	28
විදේශ ශ්‍රමය	7.84	4.59	3.25	71
අනෙකුත් ආදායම්	28.82	20.13	8.69	43
<u>වියදම්</u>				
සෘජු වියදම්	40.95	30.48	10.47	34
පරිපාලන වියදම්	31.76	29.39	2.37	8
මූල්‍ය පිරිවැය	0.021	0.063	(0.042)	67

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ ජංගම අනුපාතය 1 : 1 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී පසුගිය වර්ෂයට සාපේක්ෂව වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතවල අඩුවීමක් නිරීක්ෂණය විය. මණ්ඩලයේ මුළු වියදම් රු. මිලියන 10.48 කින් වැඩිවීමෙන් ශුද්ධ ලාභය අඩුවීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021දෙසැම්බර් 29 දින නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඇතිකර ගත් බදු ගිවිසුම ප්‍රකාරව වාර්ෂික බදු කුලිය නොගෙවීම හේතුවෙන් රු.මිලියන 0.50 ක එනම් සියයට 30 ක ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	වාර්ෂික බදු කුලිය නියමිත දිනට ගෙවීමෙන් ප්‍රමාද ගාස්තු ගෙවීම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාදය සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලය විසින් එහි සියළුම කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර 2024 වර්ෂය අවසානයට මුළු කාර්ය මණ්ඩලය 16 ක් විය. එම නිලධාරීන් වසර 01 සිට 18 දක්වා කොන්ත්‍රාත් පදනමින් සේවයේ යෙදී තිබුණ ද 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කිරීම හා මානව සම්පත් සැලසුම් සකස් කිරීම මණ්ඩලය විසින් සිදුකර නොතිබුණි.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	සුදුසුකම් සහිත පළපුරුදු කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීමට හා බඳවා ගැනීම් පටිපාටියකට අනුව බඳවා ගැනීම් සිදු කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදෙන ලද මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මණ්ඩලයේ	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් අත්පොතේ මාර්ගෝපදේශ ප්‍රකාරව කෙටුම්පත්

කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ලබා දිය යුතු වුවද 2024 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මේ දක්වා විගණකාධිපති වෙත ලබා දී නොතිබුණි. අතර 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2025 අගෝස්තු 10 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.		වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර 2023 හා 2024 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.

4.2 සංයුක්ත සැලැස්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයමගින් හඳුන්වාදෙන ලද ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය අනුව මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්ම හා ඊට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස්කර අමාත්‍යාංශයේ ලේකම් මඟින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවද පනතේ සඳහන් අරමුණු හා කාර්යභාරයන් ඉටු කරන ආකාරය දැක්වෙන උපායමාර්ගික සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් මණ්ඩලය විසින් සකස් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැයක් ද පිළියෙල කර නොතිබුණි.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව උපාය මාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

4.3 අභ්‍යන්තර විගණනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අස්ථීතයන්හි අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා එම අස්ථිත්වයේ පාලක මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකයකු පත් කළ යුතු වුවද ඒ සඳහා සුදුසුකම්ලත් අභ්‍යන්තර විගණකවරයකු මණ්ඩලය විසින් පත් කර නොතිබුණි.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	මණ්ඩලය සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම තුලින් එහි අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 විගණන කමිටුව

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පාලක මණ්ඩලයට සහායදීම පිණිස විගණන සහ කළමනාකරණ කමිටුවක් තිබිය යුතු අතර එම කමිටුව එක් එක් අස්ථිත්වයෙහි ක්‍රියාකාරීත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කර පාලක මණ්ඩලය වෙත වාර්තා කළ යුතු වුවද මෙම ආයතනය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පත්කර එම කාර්යයන් සිදු කර නොතිබුණි.	කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත.	විගණන හා කළමනාකරණ කමිටු පත්කර එහි කාර්යයන් හා නිර්දේශයන් තුලින් පාලක මණ්ඩලයේ තීරණ තවදුරටත් ඵලදායී කරවා ගැනීමට කටයුතු කළ යුතුය.